// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1837/13 - 2013 නොවැම්බර් මස 20 වැනි බදාදා - 2013.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

නිවේදනය

ද්විත්ව බදුකරණයෙන් සහන සැලසීම සඳහා ද, ආදායම් මත බදු නොගෙවා පැහැර හැරීම වැළැක්වීම සඳහා ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ බෙලාරුස් ජනරජයේ ආණ්ඩුව අතර, 2013.08.26 වැනි දින එළඹි, මෙහි උපලේඛනයේ දක්වා ඇති ගිවිසුම 2013.10.23 දින සම්මත කරගන්නා ලද යෝජනාව මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති බව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1) (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව සහ බෙලාරුස් ජනරජ ආණ්ඩුව අතර ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා වූ ගිවිසුම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ බෙලාරුස් ජනරජයේ ආණ්ඩුව අතර, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මගහැරීම වැළැක්වීම සඳහා ගිවිසුමක් ඇතිකර ගැනීමේ අභිලාශයෙන්, මතු දැක්වෙන පරිදි එකඟ වී ඇත.

*1 වැනි වගන්තිය*

*ආවරණය වන තැනැත්තන්*

ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකක හෝ දෙකෙහිම වාසිකයන් වන තැනැත්තන් කෙරෙහි මෙම ගිවිසුම අදාළ විය යුතුය.

1A - PG 1846 — 950 (2013/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*2 වැනි වගන්තිය*

*ආවරණය වන බදු*

1. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි ප්‍රාදේශීය බල මණ්ඩල වෙනුවෙන් පනවනු ලබන ආදායම් මත වන බදු වලට, ඒවා අයකරන ආකාරය පිළිබඳව නොසලකා මෙම ගිවිසුම අදාළ විය යුතුය.

2. චංචල හෝ නිශ්චල දේපල අන්සතු කිරීමෙන් ලබන ලාභ මත වන බදු, ව්‍යවසායයන් විසින් ගෙවනු ලබන මුළු වේතන හෝ වැටුප් මත බදු ද ඇතුළත්ව මුළු ආදායම මත හෝ ඒවායේ කොටසක් මත වන සියලුම බදු, ආදායම් මත වන බදු වශයෙන් සැලකිය යුතුය.

3. මෙම ගිවිසුමට අදාළ වන්නා වූ දැනට පවත්නා බදු වනුයේ ; විශේෂයෙන්

(අ) බෙලාරුස් හි දී :

(i) ආදායම මත බද්ද ;
(ii) ලාභයන් මත බද්ද ; සහ
(iii) පුද්ගලයින් මත ආදායම් බද්ද

(මින් මතු "බෙලාරුසියන් බද්ද" යනුවෙන් සඳහන් වේ)

(ආ) ශ්‍රී ලංකාවේ දී :
ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති ව්‍යවසායයන්හි පිරිවැටුම මත පදනම් වූ බද්ද ඇතුළුව, ආදායම් බද්ද ;

(මෙහි මින්මතු "ශ්‍රී ලංකා බද්ද" යනුවෙන් සඳහන් වේ)

4. දැනට පවත්නා බදු වලට අතිරේකව හෝ ඒවා වෙනුවට මෙම ගිවිසුම අත්සන් කිරීමේ දිනයෙන් අනතුරුව පනවනු ලබන ඒ හා සමාන වූ හෝ බෙහෙවින් සමාන වූ වෙනත් යම් බදු වලට ද මෙම ගිවිසුම අදාළ විය යුතු වේ. ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් ඔවුන්ගේ බදුකරණ නීති සම්බන්ධයෙන් කරනු ලැබ ඇති ප්‍රධාන වෙනස්කම් පිළිබඳව එකිනෙකාට දැනුම් දිය යුතුය.

*3 වැනි වගන්තිය*

*පොදු අර්ථ නිරූපණ*

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගත යුතු වුවහොත් මිස :

(අ) "ගිවිසුම්කාර රාජ්‍යය" සහ "අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය" යන පදවලින් පද සම්බන්ධය අනුව අවශ්‍යවන පරිදි බෙලාරුස් හෝ ශ්‍රී ලංකාව අදහස් කෙරේ;

(ආ) "බෙලාරුස්" යන පදයෙන් බෙලාරුස් ජනරජය අදහස් කෙරෙන අතර, භූගෝලීය වශයෙන් ගත්කල, බෙලාරුස් නීති යටතේ බෙලාරුස් ජනරජය යටතේ ද ජාත්‍යන්තර නීතිය, ස්වෛරී අයිතිවාසිකම් හා අධිකරණ බලයට අනුකූලව ද ක්‍රියාත්මක වන භූමි ප්‍රදේශය අදහස් කෙරේ;

(ඇ) "ශ්‍රී ලංකාව" යන පදයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථ නිරූපණය කර ඇති පරිදි ජාත්‍යන්තර නීතියට හා ස්වකීය ජාතික ව්‍යවස්ථාවලට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් සිය ස්වෛරී අයිතිවාසිකම් සහ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන හෝ මින් මතුවට ක්‍රියාත්මක කරනු ලැබිය හැකි, එහි භූමි ප්‍රදේශය, අභ්‍යන්තර ජල ප්‍රදේශ සහ රාජ්‍යයට අයත් මුහුදු ප්‍රදේශය හා ඊට ඉහළින් පිහිටි ගුවන් අවකාශය මෙන්ම අනන්‍ය ආර්ථික කලාපය සහ මහාද්වීපික තටාකයද ඇතුළුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් දේශසීමාව අදහස් කෙරේ ;

(ඈ) "තැනැත්තා" යන පදයට යම් පුද්ගලයෙක් සමාගමක්, සහ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

(ඉ) "සමාගම" යන පදයෙන් :

(i) බෙලාරුස් සම්බන්ධයෙන් ගත් විට නෛතික පුද්ගලයෙක් හෝ බදුකරණය සඳහා වෙනම ආස්ථිතියක් ලෙස සලකනු ලබන ආස්ථිතියක් ;
(ii) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට සංස්ථාපිත මණ්ඩලයක් හෝ බදු කාර්යයන් සඳහා සංස්ථාපිත මණ්ඩලයක් ලෙස සලකනු ලබන යම් ආස්ථිතියක් අදහස් කෙරේ.

(ඒ) "එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක්" සහ "අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක්" යන පදවලින් පිළිවෙලින් එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් අදහස් කෙරේ;

(ඵ) "ජාත්‍යන්තර ගමනාගමනය" යන පදයෙන්, ස්වකීය ක්‍රියාකාරි කළමනාකරණ ස්ථානය ගිවිසුම්කාර රාජ්‍යයක පිහිටි යම් ව්‍යවසායක් විසින් මෙහෙයවනු ලබන නැවක් හෝ ගුවන් යානයක් මගින්, එම නැව හෝ ගුවන් යානය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථානයන් අතර පමණක්ම ක්‍රියාත්මක කරන අවස්ථා වලදී හැර, කරනු ලබන ඕනෑම ප්‍රවාහනයක් අදහස් කෙරේ;

(ඍ) "ක්‍රියාකාරි කළමනාකරණ ස්ථානය" යන පදයෙන්, සමාගමක් සැබැවින්ම කළමනාකරණ කරනු ලබන සහ පාලනය කරනු ලබන සහ/හෝ සමාගමක කළමනාකරණය සඳහා අත්‍යවශ්‍ය වැදගත් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඉහළ මට්ටමේ තීරණ ගැනීම සිදුකරනු ලබන ස්ථානය අදහස් කෙරේ;

(එ) ගිවිසුම්කාර රාජ්‍යයකට අදාළව "ජාතිකයා" යන පදයෙන් ;

(i) එකී ගිවිසුම්කාර රාජ්‍යයේ ජාතිකත්වය හිමි යම් පුද්ගලයෙකු ;

(ii) එකී ගිවිසුම්කාර රාජ්‍යයක බලපැවැත්වෙන නීති මගින් ස්වකීය නෛතික තත්ත්වය ලබන යම් නෛතික තැනැත්තෙක් හවුල් ව්‍යාපාරයක් හෝ සංගමයක් ;

අදහස් කෙරේ;

(ඒ) "නිසි බලධාරියා" යන පදයෙන් ;

(i) බෙලාරුස් සම්බන්ධයෙන්, බෙලාරුස් ජනරජයේ බදු සහ තීරු බදු අමාත්‍යාංශය හෝ එහි බලයලත් නියෝජිතයෙකු ;

(ii) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු;

අදහස් කෙරේ ;

(ඔ) "බද්ද" යන පදයෙන් පද සම්බන්ධය අනුව අවශ්‍ය පරිදි බෙලාරුසියන් බද්ද හෝ ශ්‍රී ලංකා බද්ද අදහස් වන නමුත් මෙම ගිවිසුම අදාළ වන්නා වූ බදුවලට අදාළ යම් පැහැර හැරීමක් හෝ අත් හැරීමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු කිසියම් මුදලක් හෝ මෙම බදුවලට අදාළව පනවන ලද යම් දණ්ඩනයක් හෝ දඩ මුදලක් නියෝජනය කරන්නා වූ කිසියම් මුදලක් මෙයට ඇතුළත් නොවේ.

2. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් යම් අවස්ථාවක දී මෙම ගිවිසුම අදාළ කර ගැනීමේ දී එහි වෙනත් අයුරකින් අර්ථකථනය කොට නොමැති කිනම් හෝ පදයක්, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගැනීම අවශ්‍ය වන්නේ නම් මිස, මෙම ගිවිසුමට අදාළ වන බදු කාර්යයන් සඳහා එම රාජ්‍යයේ නීති යටතේ එම අවස්ථාවේ දරන අර්ථයම දැරිය යුතු අතර, එම රාජ්‍යයේ බලපවත්නා බදු නීති යටතේ එම පදය දරන අර්ථය, එම රාජ්‍යයේ අනෙකුත් නීති යටතේ ඊට ඇති අර්ථය ඉක්මවා අදාළ විය යුතුය.

*4 වැනි වගන්තිය*

*වාසිකයා*

1. මෙම ගිවිසුමෙහි කාර්යයන් සඳහා "ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයා" යන පදයෙන් එකී රාජ්‍යයේ නීති යටතේ යම් තැනැත්තෙකුගේ නිත්‍ය වාසය, වාසස්ථානය, නීතිගත වූ ස්ථානය, ලියාපදිංචි ස්ථානය, කළමනාකරණ ස්ථානය හෝ එවැනි සමාන ස්වභාවයක වෙනත් යම් නිර්ණායක හේතුවෙන් එම රාජ්‍යයෙහි බදු ගෙවීමට නියමිත යම් තැනැත්තෙකු අදහස් කෙරේ. කෙසේ වුවද, එම රාජ්‍යයේ ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම සම්බන්ධයෙන් පමණක් එම රාජ්‍යය තුල දී බද්දට යටත්වන යම් තැනැත්තෙකු මෙම පදයට ඇතුළත් නොවේ.

2. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන යම් පුද්ගලයෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයකු වන කල්හි, ඔහු පිළිබඳ තත්ත්වය පහත සඳහන් පරිදි තීරණය කළ යුතුය.

(අ) ඔහුට නිත්‍ය වාසස්ථානයක් තිබෙන ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහුට ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම නිත්‍ය වාසස්ථානයක් තිබේ නම් ඔහු සමඟ වඩා සමීප පෞද්ගලික හා ආර්ථික සම්බන්ධතා තිබෙන (ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වන) ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතුය ;

(ආ) ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වූ ගිවිසුම්කාර රාජ්‍යය නිගමනය කළ නොහැකි නම් හෝ එක් ගිවිසුම්කාර රාජ්‍යයකවත් ඔහුට නිත්‍ය වාසස්ථානයක් නොතිබේ නම්, ඔහුට නිතර වාසය කරන වාසස්ථානයක් ඇති රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයෙකු ලෙස ඔහු සලකනු ලැබිය යුතුය ;

(ඇ) ඔහුට ගිවිසුම්කාර රාජ්‍යයයන් දෙකෙහිම නිතර වාසය කරන වාසස්ථානයන් තිබේ නම් හෝ ඉන් එකකවත් එවැන්නක් නොතිබේ නම්, ඔහු තමා ජාතිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතුය ;

(ඈ) ගිවිසුම්කාර රාජ්‍යයයන් දෙකම ඔහුව එහි ජාතිකයෙකු ලෙස සලකන්නේ නම්, හෝ ඉන් එකක හෝ ජාතිකයෙකු නොවේ නම්, මෙම ප්‍රශ්නය ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් විසින් අන්‍යොන්‍ය එකඟත්වයකින් යුතුව නිරාකරණය කරගනු ලැබිය යුතුය.

3. මෙම වගන්තියේ 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන පුද්ගලයෙකු නොවන යම් තැනැත්තෙකු ගිවිසුම්කාර රාජ්‍යයයන් දෙකෙහිම වාසිකයෙකු වන කල්හී, එම තැනැත්තා එහි ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටා ඇති ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය. ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටි රාජ්‍යය තීරණය කළ නොහැකි අවස්ථාවන්හි දී, ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් විසින් අන්‍යොන්‍ය එකඟතාවයකින් ප්‍රශ්නය නිරාකරණය කිරීමට ප්‍රයත්න දැරිය යුතුය.

*5 වැනි වගන්තිය*

*ස්ථිර ආයතනය*

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා "ස්ථිර ආයතනය" යන පදයෙන් ව්‍යවසායෙහි ව්‍යාපාරික කටයුතු මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් කරගෙන යනු ලබන ස්ථාවර ව්‍යාපාරික ස්ථානයක් අදහස් කෙරේ.

2. "ස්ථිර ආයතනය" යන පදයට :

(අ) කළමනාකරණ ස්ථානයක් ;

(ආ) ශාඛාවක් ;

(ඇ) කාර්යාලයක් ;

(ඈ) කර්මාන්ත ශාලාවක් ;

(ඉ) වැඩ පළක් ;

(ඊ) පතලක්, තෙල් හෝ ගෑස් ආකරයක්, ගල් වලක් හෝ ස්වාභාවික සම්පත් නිස්සාරණය කෙරෙන වෙනත් යම් ස්ථානයක් ,

විශේෂයෙන් ඇතුළත් වේ.

3. "ස්ථිර ආයතනය" යන පදයට ඉහත අයුරින්ම මේවා ද ඇතුළත් වේ :

(අ) (i) ගොඩනැගිලි වැඩ බිමක්, ඉදිකිරීමක්, එකලස් කිරීමේ හෝ සවි කිරීමේ ව්‍යාපෘතියක් හෝ ඒ හා සම්බන්ධ අධීක්ෂණ කටයුතු ;

(ii) වෙනත් ව්‍යවසායක් සඳහා ස්වභාවික සම්පත් ගවේෂණය කිරීම සඳහා භාවිතා කරනු ලබන විදුම් වේදිකාවක් හෝ නැවක් හෝ ඒ සම්බන්ධ අධීක්ෂණ කටයුතු,

නමුත් එම වැඩබිම, ව්‍යාපෘතිය හෝ එහි කටයුතු අදාළ මුල්‍ය වර්ෂය තුළ ආරම්භවන හෝ අවසන් වන යම් දොළොස් මසක කාලපරිච්ඡේදයක් තුළ දින 183 කට වැඩි කාලයක් පවතී නම් පමණක් ;

(ආ) ව්‍යවසායක් විසින් එකී කාර්යය සඳහා එහි සේවකයන් හෝ වෙනත් සේවක පිරිස් යොදවා උපදේශාත්මක සේවාවන් ද ඇතුළුව සේවාවන් සැපයීම, එහෙත් එබඳු ස්වභාවයේ කටයුතු (සමාන හෝ සම්බන්ධිත ව්‍යාපෘති) ගිවිසුම්කාර රාජ්‍ය තුළ අදාළ මුල්‍ය වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන කිසියම් දොළොස් මසක කාල පරිච්ඡේදයක් තුළ එකතුව දින 183 ක් ඉක්මවන කාල පරිච්ඡේදයක් හෝ කාලපරිච්ඡේද සඳහා පවත්වාගෙන යන්නේ නම් පමණක්.

4. මෙම වගන්තියේ පූර්ණ විධිවිධානයන්හි කුමක් සඳහන් වූවද, "ස්ථිර ආයතනය" යන පදයට :

(අ) ව්‍යවසායට අයිති භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය, ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් පහසුකම් පාවිච්චි කිරීම ;

(ආ) ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය, ගබඩා කිරීමේ, ප්‍රදර්ශනය කිරීමේ හෝ අලෙවි කිරීමක් නොමැතිව බෙදාහැරීමේ කාර්යය සඳහා පමණක් තොග පවත්වාගෙන යාම ;

(ඇ) ව්‍යවසායට අයිති භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය වෙනත් ව්‍යවසායක් විසින් සකස් කිරීමේ කාර්යය සඳහා පමණක් තොග පවත්වාගෙන යාම ;

(ඈ) ව්‍යවසාය සඳහා භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ හෝ තොරතුරු රැස් කිරීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම ;

(ඉ) ව්‍යවසාය වෙනුවෙන් හුදෙක් ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් ගන්නා වෙනත් යම් කටයුත්තක් කරගෙන යනු ලැබීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම ;

(ඊ) උපජේද (අ) සිට (ඉ) දක්වා සඳහන් කරන ලද ඕනෑම කාර්යයන්ගේ එකතුවක් එහි සමස්ථ ප්‍රතිඵලය ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් ගන්නේ නම් ඒ සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම.

ඇතුළත් නොවන ලෙස සැලකිය යුතුය.

5. 7 වැනි ඡේදය අදාළ වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයෙකු වන තැනැත්තෙකු හැර යම් තැනැත්තෙකු ගිවිසුම්කාර රාජ්‍යයකදී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් වෙනුවෙන් ක්‍රියා කරන අවස්ථාවක දී, එම තැනැත්තා :

(අ) සිය කටයුතු ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් මගින් ක්‍රියාත්මක කළේ වුවද, එය ස්ථිර ආයතනයක් බවට පත් නොකරනු ලබන 4 වැනි ඡේදයේ සඳහන් කටයුතු වලට සීමා වන්නේ නම් මිස, පළමුව සඳහන් කළ රාජ්‍යයේ දී ව්‍යවසාය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමේ බලයක් ඇත්තා වූ සහ එම බලය සිරිතක් වශයෙන් ක්‍රියාත්මක කරන්නා වූ ; හෝ

(ආ) එම තැනැත්තාට එවැනි බලයක් නොමැති වුවත්, පළමු සඳහන් රාජ්‍යයේ දී සිරිතක් වශයෙන් පවත්වාගෙන යන්නා වූ භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය තොගයකින් එකී භාණ්ඩ පළමුව සඳහන් රාජ්‍යයට ගෙන ඒමට ප්‍රථම අලෙවි කර නොමැති නම් ව්‍යවසාය වෙනුවෙන් නිරතුරුව භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය බෙදාහරින්නා වූ ;

තැනැත්තෙකු වන්නේ නම් 1 වැනි හා 2 වැනි ඡේදවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම තැනැත්තා ව්‍යවසාය වෙනුවෙන් සිදු කරනු ලබන යම් කටයුතු සම්බන්ධයෙන් එම ව්‍යවසායට පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්ථිර ආයතනයක් ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

6. ගිවිසුම්කාර රාජ්‍යයක රක්ෂණ ව්‍යවසායක්, 7 වැනි ඡේදය අදාළ වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයෙකු වන්නා වූ තැනැත්තෙකු නොවන වෙනත් තැනැත්තෙකු මගින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ වාරික එකතු කිරීම සිදු කරන්නේ නම් හෝ එම භූමි ප්‍රදේශය තුළ පවතින යම් අවදානම් රක්ෂණය කරනු ලබන්නේ නම්, මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ප්‍රතිරක්ෂණ සම්බන්ධයෙන් හැර, එයට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් තිබේ යයි සලකනු ලැබිය යුතුය.

7. ස්වකීය සාමාන්‍ය ක්‍රියා පරිපාටිය අනුව ක්‍රියා කරන තැරැව්කරුවකු, සාමාන්‍ය කොමිස් නියෝජිතයෙකු හෝ ස්වාධීන තත්ත්වයක් දරන වෙනත් යම් නියෝජිතයෙකු මගින් යම් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යාපාරික කටයුතු කරගෙන යන හේතුව නිසාවෙන්ම එයට එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් තිබේ යයි නොසැලකිය යුතුය. කෙසේ වුවද, එවැනි නියෝජිතයෙකුගේ කටයුතු එම ව්‍යවසාය වෙනුවෙන් සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් කැප කොට ඇති විටෙක, සහ එම ව්‍යවසාය සහ නියෝජිතයා අතර වාණිජ සහ මූල්‍ය සබඳතාවයන්හි ස්වාධීන ව්‍යවසායන් අතර ඇති කර ගතහැකිව තිබූ ආකාරයට වඩා වෙනස් ලෙස කොන්දේසි ඇතිකර හෝ පනවා ඇති විටෙක, මෙම ඡේදයේ අර්ථය තුළ ඔහු නිදහස් තත්ත්වයක් දරන නියෝජිතයෙකු ලෙස සලකනු නොලැබිය යුතුය.

8. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික සමාගමක්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක් පාලනය කිරීම හෝ එවැනි සමාගමක් විසින් පාලනය කරනු ලැබීම හෝ (ස්ථිර ආයතනයක් මගින් හෝ වෙනත් යම් ආකාරයකට) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යාපාරයන් කරගෙන යාම යන කරුණු හේතුවෙන්ම, එක් සමාගමක් අනෙකෙහි ස්ථිර ආයතනයක් නොවිය යුතුය.

*6 වැනි වගන්තිය*

*නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායම*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි (කෘෂිකර්මයෙන් හෝ වන වගාවෙන් ලබන ආදායම ද ඇතුළුව) නිශ්චල දේපළවලින් ලබන ආදායම එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

2. "නිශ්චල දේපළ" යන පාඨයට, ප්‍රශ්නයට තුඩු දී ඇති දේපළ පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිය යටතේ එම පාඨය දරන අර්ථයම දැරිය යුතු ය. නැව් සහ ගුවන් යානා නිශ්චල දේපළ ලෙස සලකනු නොලැබිය යුතු ය. කුමන අවස්ථාවක දී වුවද නිශ්චල දේපළවලින් ලැබෙන මෙම වගන්තියට අනුකූලව බදු අය කළහැකි ආදායමට, නිශ්චල දේපළවලට අනුබද්ධ වන දේපළ, පශු සම්පත් සහ කෘෂිකර්මයෙහි දී සහ වන වගාවෙහි දී පාවිච්චි කරන උපකරණ, ඉඩකඩම් දේපළ සම්බන්ධ සාමාන්‍ය නීතියේ විධිවිධාන අදාළ වන අයිතිවාසිකම්, නිශ්චල දේපළවල භුක්තිය සහ ඛණිජ නිධි, ප්‍රභවයන් සහ වෙනත් ස්වාභාවික සම්පත්වල වැඩ කිරීම හෝ වැඩ කිරීමේ අයිතිවාසිකම සඳහා ප්‍රතිෂ්ඨා වශයෙන් විචල්‍ය හෝ ස්ථිර ගෙවීම් ලැබීමේ අයිතිවාසිකම් යන මේවා කෙළින්ම ප්‍රයෝජනයට ගැනීමත්, කුලියට දීමෙන් හෝ වෙනයම් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීමෙන් ලබන ආදායම ඇතුළත් වියයුතුය.

3. 1 වැනි සහ 2 වැනි ඡේදවල විධිවිධාන, යම් ව්‍යවසායක නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායමට, ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කිරීම සඳහා යොදා ගන්නා නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායමට ද අදාළ විය යුතුය.

### *7 වැනි වගන්තිය*

*ව්‍යාපාර ලාභ*

1. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායයක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේ නම් මිස, එම ව්‍යවසායෙහි ලාභ බද්දට යටත් කළ හැකි වන්නේ එකී ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණකි. ව්‍යවසාය ඉහත කී පරිදි ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යන්නේ නම් එහි ලාභ අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි නමුත්, එසේ බද්දට යටත් කළ හැක්කේ එම ස්ථිර ආයතනයට ආරෝපණය කළ හැකි ප්‍රමාණයට පමණකි.

2. 3 වන ඡේදයේ විධිවිධාන වලට යටත්ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින්, එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්වකීය ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවකදී, එම ස්ථිර ආයතනය, එය ස්ථිර ආයතනයක් වන්නේ කවර ව්‍යවසායකද, එම ව්‍යවසාය සමග එම තත්ත්වයන් හෝ සමාන තත්ත්වයන් යටතේ, එම කටයුතු වලට හෝ ඒ හා සමාන කටයුතුවල සම්පූර්ණයෙන් ම, ස්වාධීනව නිරත වෙනස් හා වෙන් වූ ව්‍යවසායක් වූයේ නම් ඊට ලැබෙතැයි අපේක්ෂා කළහැකි ලාභ, එම ස්ථිර ආයතනයට ලැබුණු ලෙස එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේදී සලකනු ලැබිය යුතු ය.

3. ස්ථිර ආයතනයක ලාභ තීරණය කිරීමේදී විධායක සහ පොදු පරිපාලන වියදම් ද ඇතුළුව එම ස්ථිර ආයතනයේ ව්‍යාපාරික කාර්යයන් සඳහා දරන ලද වියදම් එම ස්ථිර ආයතනය පිහිටි රාජ්‍යයෙහි හෝ වෙනත් ස්ථානයක දී හෝ දරනු ලැබුවේ වුව ද, ඒවා අඩු කිරීම් ලෙස ඉඩදිය යුතුය. කෙසේ වුවද, (සත්‍ය වශයෙන්ම දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම පමණක් හැර) රාජ්‍ය භාග, පේටන්ට්, හෝ වෙනත් අයිතිවාසිකම් භාවිතා කිරීම වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු හෝ වෙනත් ඒ හා සමාන ගෙවීම්, හෝ විශේෂිත ස්වරූපයේ සේවාවන් ඉටු කිරීම සඳහා, හෝ කළමනාකරණය සඳහා කොමිස් වශයෙන් හෝ, බැංකු ව්‍යවසායයක් වන අවස්ථාවක දී හැර, ස්ථිර ආයතනයකට ණයට දෙන ලද මුදල් මත පොලිය වශයෙන් හෝ, ස්ථිර ආයතනය විසින් ව්‍යවසායේ ප්‍රධාන කාර්යාලයට හෝ එහි වෙනත් කාර්යාලයකට ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් වෙතොත් ඒ සම්බන්ධයෙන්, කිසිම අඩු කිරීමකට ඉඩ නොදිය යුතුය. එසේම (සත්‍ය වශයෙන්ම දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම පමණක් හැර) රාජ්‍ය භාග, පේටන්ට් හෝ වෙනත් අයිතිවාසිකම් භාවිතා කිරීම වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු හෝ වෙනත් ඒ හා සමාන හෝ විශේෂිත ස්වරූපයේ සේවාවක් ඉටුකිරීම සඳහා හෝ කළමනාකරණය සඳහා කොමිස් වශයෙන් හෝ, බැංකු ව්‍යවසායක් වන අවස්ථාවක දී හැර, ව්‍යවසායේ ප්‍රධාන කාර්යාලයට හෝ එහි වෙනත් යම් කාර්යාලයකට ණයට දෙන ලද මුදල් මත වන පොලිය වශයෙන් හෝ ස්ථිර ආයතනය විසින් ව්‍යවසායයේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ එහි වෙනත් කාර්යාලයකින් අය කරන ලද මුදල් ප්‍රමාණයන්, ස්ථිර ආයතනයේ ලාභ නිර්ණය කිරීමේ දී ගණන් නොගත යුතු ය.

4. ව්‍යාපාරයේ මුළු ලාභය, එහි විවිධ කොටස්වලට විභජනය කිරීමේ ක්‍රමය පදනම් කොටගෙන ස්ථිර ආයතනයකට ආරෝපණය කළයුතු ලාභ නිර්ණය කිරීම ගිවිසුම්කාර රාජ්‍යයක සිරිතක්ව පවතින තාක්කල් මෙම වගන්තියේ 2 වැනි ඡේදයෙහි ඇති කිසිවක් එම ගිවිසුම්කාර රාජ්‍ය එසේ සිරිතක් ලෙස කළහැකි විභජනය මගින් බදු අය කළහැකි ලාභ නිර්ණය කිරීමෙන් නොවැළැක්විය යුතුය. කෙසේ වුවද, අනුගමනය කරන විභජනය කිරීමේ ක්‍රමයෙන් ලබන ප්‍රතිඵලය මෙම වගන්තියේ ඇතුළත් මූලධර්මයන්ට අනුකූල විය යුතු ය.

5. එම ස්ථිර ආයතනය විසින් ව්‍යවසාය සඳහා භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍යවල හුදු මිලයට ගැනීම පමණක්ම හේතු කොටගෙන ස්ථිර ආයතනයට යම් ලාභයක් ආරෝපණය නොකළ යුතු ය.

6. ඉහත කී ඡේදයන්හි කාර්යයන් සඳහා, එසේ නොකිරීමට සුදුසු හා ප්‍රමාණවත් හේතු ඇත්තේ නම් මිස, වර්ෂයෙන් වර්ෂයට එකම ක්‍රමය මගින් ස්ථිර ආයතනයකට ආරෝපණය කළයුතු ලාභය තීරණය කළ යුතු ය.

7. මෙම ගිවිසුමෙහි වෙනත් වගන්තිවල වෙනම සඳහන් කරනු ලැබ ඇති ආදායම් අයිතම ලාභවලට ඇතුළත් වන අවස්ථාවක දී, එකී වගන්තිවල විධිවිධාන සම්බන්ධයෙන් මෙම වගන්තියේ විධිවිධාන බල නොපෑ යුතු ය.

*8 වැනි වගන්තිය*

*නාවික සහ ගුවන් ප්‍රවාහනය*

1. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා ගුවන් යානා මෙහෙයුම් කිරීමෙන් උපයනු ලබන ලාභවලින් බදු අය කළ හැක්කේ ව්‍යවසායේ ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටා ඇති ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණි.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා නැව් මෙහෙයුම් කිරීමෙන් ලබන ලාභ වලින් එකී අනෙක් රාජ්‍යයේ දී බදු අය කළ හැකි නමුත් එසේ අය කරනු ලබන බද්ද එයින් සියයට 50 කට සමාන ප්‍රමාණයකින් අඩු කළ යුතු ය.

3. නාවික ව්‍යවසායක ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය නැවක පිහිටුවා ඇත්නම්, එම ස්ථානය නැවේ දේශීය වරාය පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටා ඇති බවට සැලකිය යුතු අතර, එවැනි දේශීය වරායක් නොමැති නම් ඒ නැවේ මෙහෙයුම්කරු වාසික වන ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටා ඇති බව සැලකිය යුතු ය.

4. බද්ධ ව්‍යාපාරයකින් හෝ ජාත්‍යන්තර මෙහෙයුම් නියෝජිතායතනයකට සහභාගි වීමෙන් ලැබෙන ලාභවලට ද 1 වන හා 2 වන ඡේදවල විධිවිධාන අදාළ වියයුතු ය.

*9 වැනි වගන්තිය*

*සම්බන්ධිත ව්‍යවසායයන්*

1. (අ) ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායයක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණය, පාලනය හෝ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍ර ලෙස සහභාගී වන, හෝ

(ආ) එකම තැනැත්තන් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණයට, පාලනයට හෝ ප්‍රාග්ධනයට සෘජුව හෝ වක්‍ර ලෙස සහභාගී වන අවස්ථාවක,

සහ ඒ අවස්ථා දෙකින් කවර අවස්ථාවකදී වුවද, ස්වාධීන ව්‍යවසායයන් අතර පවත්නා වාණිජ්‍ය හා මූල්‍ය සම්බන්ධතා පිළිබඳ කොන්දේසිවලට වෙනස් කොන්දේසි ඒ ව්‍යවසායන් දෙක අතර පිළියෙළ කර හෝ පනවා ඇති කල්හි, ඒ කොන්දේසි නොතිබුණි නම් ඒ ව්‍යවසායන්ගෙන් එකකට උපචිත විය හැකි වූ නමුත්, ඒ කොන්දේසි නිසා එසේ උපචිත නොවූ කවර ලාභ වුවද, ඒ ව්‍යවසායයේ ලාභ වලට ඇතුලත් කර, ඒ අනුව ලාභ මත බදු අය කළ හැකි ය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක් එහි ව්‍යවසායක ලාභයෙහි ඇතුළත් කරනු ලබන සහ ඒ අනුව බදු කරනු ලබන, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක එකී රාජ්‍යයේ බද්දට යටත් කරන ලද ලාභය, ව්‍යවසායන් දෙක අතර ඇති කරගත් කොන්දේසි ස්වාධීන ව්‍යවසායන් අතර ඇති කරගත හැකිව තිබූ කොන්දේසිම වූ විටෙක, පළමුව සඳහන් කරන ලද රාජ්‍යයේ ව්‍යවසායකට උපචිත විය යුතු වූ විට ඒ අනුව අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී පනවනු ලැබූ බදු ප්‍රමාණයට යෝග්‍ය ගැලපුමක්, එම ගැලපුම් සිදුකිරීම සාධාරණ බවට සලකනු ලබන්නේ නම්, එම අනෙක් රාජ්‍යය විසින් සිදු කරනු ලැබිය යුතු ය. එවැනි ගැලපුමක් තීරණය කිරීමේදී මෙම ගිවිසුමේ අනෙකුත් විධිවිධාන කෙරෙහි ද නිසි අවධානය යොමු කළ යුතු අතර, අවශ්‍ය වන්නේ නම්, ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධාරීන් එකිනෙකා විමසිය යුතු වන්නේ ය.

*10 වැනි වගන්තිය*

*ලාභාංශ*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන ලාභාංශ එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කල හැකි ය.

2. කෙසේ වුවද, ලාභාංශ ගෙවන සමාගම වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයෙහිදී ද, එම රාජ්‍යයේ නීති වලට අනුකූලව එවැනි ලාභාංශ වලින් බදු අය කළ හැකි නමුත්, ලාභාංශවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එසේ අය කරන බද්ද ;

(අ) අර්ථලාභී හිමිකරු, ලාභාංශ ගෙවනු ලබන සමාගමෙහි ප්‍රාග්ධනයෙන් අඩු වශයෙන් සියයට 25 ක් සඳහා හිමිකම් සහිත (හවුල් ව්‍යාපාරයක් නොවන) සමාගමක් නම්, දළ ලාභාංශ ප්‍රමාණයෙන් සියයට 7.5 කට ද ,

(ආ) අන් සියලුම අවස්ථාවල දී දළ ලාභාංශ ප්‍රමාණයෙන් සියයට 10 කට ද,

වැඩි නොවිය යුතු ය.

ලාභාංශ ගෙවනු ලබන සමාගමේ ලාභ සම්බන්ධයෙන්, සමාගමෙන් බදු අය කිරීම කෙරෙහි මෙම ඡේදයේ විධිවිධාන බල නොපෑ යුතු ය.

3. මෙම වගන්තියෙහි යොදා ගනු ලැබ ඇති පරිදි "ලාභාංශ" යන පදයෙන් කොටස් වලින් හෝ වෙනත් අයිතිවාසිකම්වලින් ලබන ආදායම වන්නා වූ හෝ ණය හිමිකම් නොවන්නා වූ ලාභයට සහභාගීවීමෙන් ලබන ආදායම මෙන්ම බෙදාහැරීම කරනු ලබන සමාගම වාසික වන ගිවිසුම්කාර ආකාරයටම බදුකරණයට භාජනය වන්නා වූ වෙනත් අයිතිවාසිකම්වලින් ලබන ආදායම ද අදහස් කෙරේ.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නා වූ, ලාභාංශවල අර්ථලාභී හිමිකරු, ලාභාංශ ගෙවන සමාගමක වාසික අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් හෝ එහි පිහිටි ස්ථාවර පදනමක් මගින් ස්වාධීන පුද්ගල සේවාවක් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය තුළ ඉටු කරන්නේ නම් සහ ලාභාංශ ගෙවනු ලබන ධාරකය එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමග ඵලදායී ලෙස සම්බන්ධව පවතී නම්, 1 වැනි හා 2 වැනි ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි අවස්ථාවන්හිදී අවස්ථාවෝචිත පරිදි 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

5. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙන් ලාභ හෝ ආදායම් උපයන අවස්ථාවක, සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශ මත, එවැනි ලාභාංශ එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන විටක හැර හෝ එම අනෙක් රාජ්‍යයේ පිහිටි ස්ථිර ව්‍යවසායකට හෝ ස්ථිර පදනමකට ඵලදායී ලෙස සම්බන්ධ වී ඇති ධාරකයන් සම්බන්ධයෙන් වන විටෙක හැර, සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශ සම්බන්ධයෙන් බදු කිසිවක් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් නොපනවා සිටිය හැකිවාක් මෙන්ම, ගෙවන ලද ලාභාංශ හෝ නොබෙදූ ලාභ එම අනෙක් රාජ්‍යයෙහි පැන නගින ලාභ හෝ ආදායම් වලින් මුළු හෝ අඩ වශයෙන් සමන්විත වන්නේ වුවද සමාගමේ නොබෙදූ ලාභ, සමාගමේ නොබෙදූ ලාභ මත වන බද්දකට භාජනය නොකර සිටිය හැකි ය.

*11 වැනි වගන්තිය*

*පොළිය*

1. ගිවිසුම්කාර රාජ්‍යයකදී උද්ගත වන පොළිය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන විටකදී, එම පොළිය එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. කෙසේ වුවද, එම පොළියෙන් එය උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී ද, එම රාජ්‍යයේ නීතිය අනුව බදු අය කළ හැකි නමුත්, පොළියේ අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වේ නම්, එසේ අයකරනු ලබන බද්ද දළ පොලී ප්‍රමාණයෙන් සියයට 10ක් නොඉක්ම විය යුතු ය.

3. 2 වන ඡේදයේ විධිවිධාන නොසලකා, ගිවිසුම්කාර රාජ්‍යයකදී උද්ගතවන වන්නා වූ සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන්නා වූ පොළිය, පොළියෙහි අර්ථලාභී හිමිකරු ;

(i) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ රජය හෝ එහි ප්‍රාදේශීය බල මණ්ඩලයක් ;

(ii) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ජාතික (මහ) බැංකුව ;

(iii) ගිවිසුම්කාර රාජ්‍යයන්හි රජයන් හෝ ගිවිසුම්කාර රාජ්‍යයන්හි රජයන් විසින් බලය පවරන ලද බලධාරීන් විසින් කලින් කලට එකඟ විය හැකි ලැයිස්තුව පරිදි අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ රජය විසින් පූර්ණ හිමිකම් ඇති මූල්‍ය සංවිධාන (ආයතන) වන්නේ නම්,

පළමු සඳහන් රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් වේ.

4. මෙම වගන්තියේ යෙදී තිබෙන "පොළිය" යන පදයෙන් උකසක් මගින් ඇප තබා ඇති හෝ නැති, ණයගැතියාගේ ලාභවලට සහභාගීවීමේ අයිතිවාසිකම් සහිත හෝ රහිත, සියලු වර්ගයන්හි ණය හිමිකම්වලින් ලැබෙන ආදායම සහ විශේෂයෙන් රජයේ සුරැකුම්පත් සහ බැඳුම්කර හෝ ඍණ පත්‍රවලින් ලැබෙන ආදායම, එවැනි සුරැකුම්පත්වලට, බැඳුම්කරවලට හෝ ඍණ පත්‍රවලට බැඳී ඇති අධි මිල සහ ත්‍යාග ඇතුළත් ආදායම අදහස් වේ. මෙම වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රමාද ගෙවීම් වෙනුවෙන් අය කරන දණ්ඩන ගාස්තු පොළිය ලෙස සලකනු නොලැබිය යුතු ය.

5. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නා වූ පොලී ආදායමෙහි අර්ථලාභී හිමිකරු, පොළිය උද්ගතවන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යන්නේ නම් හෝ එකී අනෙක් රාජ්‍යයෙහි පිහිටා ඇති ස්ථාවර පදනමක් මගින් ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කරනු ලබන්නේ නම් සහ පොළිය ගෙවනු ලබන ණය හිමිකම, එකී ස්ථිර ආයතනය සමග හෝ ස්ථාවර පදනම සමග හෝ ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම් 1 වන සහ 2 වන ඡේදයන්හි විධිවිධාන අදාළ නොවිය යුතු ය. එවැනි අවස්ථාවලදී මෙම ගිවිසුමෙහි අවස්ථාවෝචිත පරිදි 7 වන වගන්තියේ සහ 14 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

6. පොළිය ගෙවන්නා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන කල්හි, පොළිය එම රාජ්‍යයේදී උද්ගත වන ලෙස සැලකිය යුතු ය. කෙසේ වෙතත්, එම පොළිය ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුවද, නොවූ ව ද, ඔහුට පොළිය ගෙවීමට උපචිත වූ ණයගැති භාවය හා සම්බන්ධ වූ ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක තිබෙන අවස්ථාවකදී සහ එම පොළිය දරනු ලබන්නේ එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම විසින් නම්, එවිට ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම තිබෙන රාජ්‍යයේ දී එම පොළිය උද්ගත වන ලෙස සැලකිය යුතු ය.

7. ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනා සහ වෙනත් යම් තැනැත්තෙකු අතර විශේෂ සම්බන්ධතාවයක් පැවතීම හේතුවෙන් ණය හිමිකම් සම්බන්ධයෙන් ගෙවනු ලබන පොළී ප්‍රමාණය, එවැනි සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී ගෙවන්නා සහ අර්ථලාභී හිමිකම් ඇති තැනැත්තා විසින් එකඟ විය හැකිව තිබුණු ප්‍රමාණය ඉක්මවන්නේ නම්, මෙම වගන්තියේ විවිධිවිධාන බල පැවැත්විය යුත්තේ අවසානයේ සඳහන් කළ ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක ගෙවීම් වල අතිරික්ත කොටස, මෙම ගිවිසුමෙහි අනෙක් විධිවිධාන සුදුසු පරිදි සැලකිල්ලට ගනිමින්, ඒ ඒ ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව තවදුරටත් බදුවලට යටත් කළ යුතු ය.

*12 වැනි වගන්තිය*

*රාජ්‍යභාග*

1. ගිවිසුම්කාර රාජ්‍යයක උද්ගත වන සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වෙත ගෙවන රාජ්‍යභාග ඒ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. කෙසේ වුවද, එම රාජ්‍යභාග, ඒවා උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයේ දි ද, එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව බද්දට යටත් කළ හැකි වේ. එහෙත් රාජ්‍යභාගවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයකු වන්නේ නම්, එසේ අය කෙරෙන බද්ද එම රාජ්‍යභාගවල දළ ප්‍රමාණයෙන් සියයට 10 නොඉක්මවිය යුතු ය.

3. මෙම වගන්තියේ යොදා ඇති පරිදි "රාජ්‍යභාග" යන පදයෙන් සිනමා රූපක චිත්‍රපට හෝ චිත්‍රපට සහ ගුවන් විදුලි හෝ රූපවාහිනී විකාශන සඳහා යොදා ගන්නා පටල, හඬ පටි ඇතුළුව කිසියම් සාහිත්‍යමය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතියක ප්‍රකාශන අයිතියක්, කිසියම් පේටන්ට් බලපත්‍රයක්, වෙළෙඳ ලකුණක්, මෝස්තරයක් හෝ ආදර්ශකයක්, පරිගණක මෘදුකාංග වැඩ සටහනක්, පිඹුරක්, රහස්‍ය වට්ටෝරුවක් හෝ ක්‍රියාවලියක් භාවිතා කිරීම සඳහා හෝ භාවිතා කිරීමට අයිතිය ලබාගැනීම සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ලබන්නාවූ ද, හෝ කාර්මික උපකරණ ප්‍රවාහනය සඳහා වන වාහන ඇතුලුව වාණිජමය උපකරණ හෝ විද්‍යාත්මක උපකරණ හෝ විද්‍යාත්මක, විද්‍යාත්මක, වාණිජ්‍යමය හෝ කාර්මික අත්දැකීම් පිළිබඳ තොරතුරු, භාවිතා කිරීමට හෝ භාවිතා කිරීමේ අයිතිය සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ලැබුණු ඕනෑම වර්ගයක ගෙවීමක් අදහස් කෙරෙයි.

4. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු වන්නාවූ රාජ්‍යභාගවල අර්ථලාභී හිමිකරු එම රාජ්‍යභාග උද්ගත වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී, එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නේ නම් හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය තුළ පිහිටි ස්ථාවර පදනමක් මගින් ස්වාධීන පුද්ගලික සේවා ඉටුකරන්නේ නම් සහ රාජ්‍යභාග ගෙවනු ලබන අයිතිවාසිකම හෝ දේපළ එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමඟ ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම්, මෙම වගන්තියේ 1 වන සහ 2 වන ජේදවල විධිවිධාන අදාළ නොවිය යුතු ය. එවැනි අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

5. රාජ්‍යභාග ගෙවන්නා වාසිකයෙකු වන රාජ්‍යයේම, එම රාජ්‍යභාග උද්ගත වන්නේ යැයි සැලකිය යුතුය. එසේ වුවද, රාජ්‍යභාග ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුව ද, නොවූ ව ද, රාජ්‍යභාග ගෙවීමේ වගකීම හා බැඳුනු ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක ඔහු සතුව තිබේ නම් සහ එම රාජ්‍යභාග එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම මගින් දරනු ලබන්නේ නම්, එවැනි අවස්ථාවක එම ස්ථිර ආයතනය පිහිටි රාජ්‍යයේ දී එම රාජ්‍යභාග උද්ගත වන ලෙස සැලකිය යුතු ය.

6. ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනාම සහ වෙනත් යම් තැනැත්තෙකු අතර පවත්නා විශේෂ සම්බන්ධතාවයක් නිසා, ඒවා ගෙවනු ලබන භාවිතය, අයිතිවාසිකම හෝ තොරතුරු සැලකිල්ලට ගනිමින්, ගෙවනු ලබන රාජ්‍යභාග ප්‍රමාණය, එවැනි සම්බන්ධතාවයක් නොමැති විට ගෙවන්නා සහ ලබන්නා විසින් එකඟවිය හැකිව තිබුණු ප්‍රමාණය ඉක්මවන විට, මෙම වගන්තියේ විධිවිධාන අදාළ විය යුත්තේ අවසානයට සඳහන් ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක මෙම ගිවිසුමෙහි අනෙක් විධිවිධානයන් කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින්, ගෙවීම්වල අතිරික්තය එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුකූලව තවදුරටත් බද්දට යටත් විය යුතු ය.

*13 වැනි වගන්තිය*

*ප්‍රාග්ධන ලාභ*

(දේපළ අන්සතු කිරීමෙන් ලද ලාභ)

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින්, 6 වැනි වගන්තියෙහි සඳහන් කර ඇත්තා වූ ද, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටියා වූ ද, නිශ්චල දේපළ අන්සතු කිරීමෙන් ලබන ලාභ, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළහැකි ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායකට අයත් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි තිබෙන ස්ථිර ආයතනයක ව්‍යාපාර දේපළ වලින් කොටසක් වන චංචල දේපළ අන්සතු කිරීමෙන් හෝ ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි තිබෙන ස්ථාවර පදනමකට අදාළව ස්වාධීන පුද්ගලික සේවා සැපයීම සඳහා පවතින චංචල දේපළ අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ, එම ස්ථිර ආයතනය (එය පමණක් හෝ සම්පූර්ණ ව්‍යවසාය සමඟ) හෝ එකී ස්ථාවර පදනම අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ ද ඇතුළුව, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් අන්තර්ජාතික ගමනාගමනයෙහි යොදවන ලද නැව් හෝ ගුවන් යානා හෝ එවැනි නැව් හෝ ගුවන් යානා මෙහෙයවීමට අදාළ චංචල දේපළ අන්සතු කිරීමෙන්, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් ලබන ලාභ, ව්‍යවසායයේ ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පවතින ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතුය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් සමාගමක කොටස් හෝ කොටස් ප්‍රාග්ධනයට සහභාගිවීමේ අයිතිය අන්සතු කිරීමෙන් කෙළින්ම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි නිශ්චල දේපළක් මගින් සමාගමේ වත්කම් වලින් සියයට 50 කට වඩා ලබයි නම් එකී ලාභ, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ බද්දට යටත් කළ හැකි ය.

5. 1, 2, 3 හා 4 වන ඡේදවල සඳහන් නොවූ, යම් දේපළක් අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ, ඒවා පවරා ගනු ලබන තැනැත්තා පදිංචි වී සිටින ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

*14 වැනි වගන්තිය*

*ස්වාධීන පෞද්ගලික සේවා*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික පුද්ගලයෙකු විසින් වෘත්තීය සේවා හෝ සමාන ස්වභාවයේ වෙනත් ස්වාධීන ක්‍රියාකාරකම් ඉටු කිරීම වෙනුවෙන් ලබන ආදායම, එම ආදායම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ද බද්දට යටත් කළ හැකි පහත සඳහන් අවස්ථාවල දී හැර, එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

(අ) ඔහුට තම කටයුතු ඉටුකර ගැනීම සඳහා අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිරන්තරවම ස්ථාවර පදනමක් ඇති කල්හි, එම ස්ථාවර පදනමට ආරෝපණය කළහැකි ආදායම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය ; හෝ

(ආ) ඔහු අදාළ මූල්‍ය වර්ෂයේදී ආරම්භ වන හෝ අවසන්වන මාස 12 ක කාල පරිච්ඡේදයක් තුළ දී එකතුව දින 183 ක් ඉක්මවන කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේදයන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ගත කරයි නම් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී ඔහු සිය කටයුතුවලින් ලබන ආදායම පමණක් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළහැකි ය.

2. "වෘත්තීය සේවා" යන පදයට ස්වාධීන, විද්‍යාත්මක, සාහිත්‍යමය, කලාත්මක, අධ්‍යාපනික හෝ ඉගැන්වීමේ ක්‍රියාකාරකම් මෙන්ම වෛද්‍යවරුන්ගේ, නීතිඥයින්ගේ, ඉංජිනේරුවරුන්ගේ, ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ, දන්ත වෛද්‍යවරුන්ගේ සහ ගණකාධිකාරිවරුන්ගේ ස්වාධීන ක්‍රියාකාරකම් ද විශේෂයෙන් ඇතුළත් වේ.

3. "ස්ථාවර පදනම" යන පදයට යම් පුද්ගලයෙකු සම්පූර්ණයෙන් හෝ කොටසක් ලෙසින් ස්වාධීන පෞද්ගලික සේවා සිදුකරනු ලබන කාර්යාලයක් හෝ ඉඩකඩක් ඇතුළත් ය.

*15 වැනි වගන්තිය*

*පරායත්ත පෞද්ගලික සේවා*

1. 16, 18 හා 19 වන වගන්තිවල විධිවිධානයන්ට යටත්ව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු සේවා නියුක්තියකින් ලබන වැටුප්, වේතන සහ එවැනි වෙනත් පාරිශ්‍රමිකයන්, එකී සේවා නියුක්තියෙහි යෙදෙන්නේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි නොවන්නේ නම්, එකී රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් වියයුතු ය. එසේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී සේවා නියුක්තියෙහි යෙදෙන්නේ නම්, එම සේවා නියුක්තියෙන් ලබන පාරිශ්‍රමික එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

2. 1 වැනි ඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන් වූවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි යෙදෙන සේවා නියුක්තියකින් ලබන පාරිශ්‍රමිකය ;

(අ) එම පාරිශ්‍රමිකය ලබන්නා අදාළ මූල්‍ය වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන යම් දොළොස් මාසයක කාලපරිච්ඡේදයක් තුළ එකතුව දින 183 කට නොවැඩි කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේදයන් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි සිටින්නේ නම් ; සහ

(ආ) එම පාරිශ්‍රමිකය, එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු නොවන සේවා යෝජකයෙකු විසින් හෝ වෙනුවෙන් ගෙවනු ලබන්නේ නම් ; සහ

(ඇ) එම පාරිශ්‍රමිකය, සේවා යෝජකයාට එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයකින් හෝ ස්ථාවර පදනමකින් දරනු නොලබන්නේ නම්,

එකී පළමුව සඳහන් කළ රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතු ය.

3. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා මෙහෙයවනු ලබන නැවක හෝ ගුවන් යානයක කරනු ලබන සේවා නියුක්තියක් සම්බන්ධයෙන් ලබන පාරිශ්‍රමිකය, ව්‍යවසායේ ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටි රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

*16 වැනි වගන්තිය*

*අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු*

ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ලබන අධ්‍යක්ෂ ගාස්තු හා වෙනත් සමාන ගෙවීම්, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

*17 වැනි වගන්තිය*

*විනෝදය සපයන්නන් සහ ක්‍රීඩකයන්*

1. 14 වැනි සහ 15 වැනි වගන්තිවල විධිවිධානයන්හි කුමක් සඳහන් වූවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසික පුද්ගලයෙකු විනෝදය සපයන්නෙකු ලෙස නාට්‍ය, චලන චිත්‍රපට හෝ සර්කස් හෝ ගුවන් විදුලි හෝ රූපවාහිනී ශිල්පියකු වැනි කලා ශිල්පියෙකු හෝ සංගීතඥයකු හෝ ක්‍රීඩකයකු වශයෙන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී ස්වකීය පුද්ගලික කටයුතු නිරත වීමෙන් උපයනු ලබන ආදායම, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. විනෝදය සපයන්නෙකු හෝ ක්‍රීඩකයකු විසින් එබඳු ස්වකීය පුද්ගලික කටයුතු වල නිරතවීම සම්බන්ධයෙන් වන ආදායම, එම කලා ශිල්පියාටම හෝ ක්‍රීඩකයාටම නොව, වෙනත් තැනැත්තෙකුට උපචිත වන අවස්ථාවකදී, 7 වැනි, 14 වැනි සහ 15 වැනි වගන්තිවල කුමක් සඳහන් වුවද, එම ආදායම විනෝදය සපයන්නාගේ හෝ ක්‍රීඩකයාගේ කටයුතු ක්‍රියාත්මක වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

3. 1 වන සහ 2 වන ඡේදයන්හි විධිවිධානවල කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයන් අතර පවතින සංස්කෘතික ගිවිසුමක් හෝ වැඩ පිළිවෙලක් යටතේ සිදුවන 1 වන ඡේදයෙහි සඳහන් ක්‍රියාකාරකම්වලින් උද්ගත වන ආදායම එම සංචාරය සඳහා ආධාර, පූර්ණ හෝ ප්‍රමාණවත් පරිදි ගිවිසුම්කාර රාජ්‍යයන් අතුරින් එකක, ගිවිසුම්කාර රාජ්‍ය දෙකෙහිම හෝ එහි ප්‍රාදේශීය බලමණ්ඩලයක් විසින් ලබාදී ඇති විට, එම ක්‍රියාකාරකම් සිදුවන ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් කළ යුතු ය.

*18 වැනි වගන්තිය*

*විශ්‍රාම වැටුප් සහ වාර්ෂික*

1. 19 වන වගන්තියේ 2 වන ඡේදයේ විධිවිධානයන්ට යටත්ව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි අතීත සේවා නියුක්තිය හෝ සේවාව සැළකිල්ලට ගෙන එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙන් ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සහ ඊට සමාන පාරිශ්‍රමික, සහ එවැනි වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙන් ගෙවනු ලබන වාර්ෂික එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. "වාර්ෂික" යන පදයෙන් මුදලින් හෝ මුදලේ වටිනාකමේ ප්‍රමාණවත් හා සම්පූර්ණ ප්‍රතිෂ්ඨාවක් සඳහා ගෙවීම් කිරීමේ බැඳියාවක් යටතේ, ආයු කාලය තුළ දී හෝ නිශ්චිතව සඳහන් කරන ලද හෝ නිශ්චය කළහැකි කාල පරිච්ඡේදයක් තුළ දී, ප්‍රකාශිත වේලාවන්හී දී කාලීනව ගෙවිය යුතු වන ප්‍රකාශිත මුදලක් අදහස් කෙරේ.

3. 1 වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසික පුද්ගලයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පොදු යෝජනා ක්‍රමයක් හෝ සමාජ ආරක්ෂණ ව්‍යවස්ථා යටතේ ලබන විශ්‍රාම වැටුප් සහ අනෙකුත් සමාන පරිශ්‍රමික බද්දට යටත් වනුයේ එම අනෙක් රාජ්‍යයේ දී පමණි.

*19 වැනි වගන්තිය*

*ආණ්ඩුවේ සේවය*

1. (*අ*) ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි ප්‍රාදේශීය බල මණ්ඩලයක් විසින් එම රාජ්‍යය හෝ බල මණ්ඩලය වෙත ඉටුකරන ලද සේවාවන් වෙනුවෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන විශ්‍රාම වැටුප් නොවන වැටුප්, වේතන සහ වෙනත් සමාන පාරිශ්‍රමික එම රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළයුතු ය.

(*ආ*) කෙසේ වුවද, එම පුද්ගලයා එම සේවාවන් ඉටු කරන ලද්දේ අනෙක් රාජ්‍යයෙහි දී නම් සහ ඔහු එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එකී පුද්ගලයා ;

(i) එම රාජ්‍යයේ ජාතිකයෙකු වේ නම් ; හෝ

(ii) හුදෙක් එම සේවාවන් ඉටු කිරීමේ කාර්යය සඳහාම පමණක් එම රාජ්‍යයේ වාසිකයෙකු බවට පත් නොවූ පුද්ගලයෙකු නම් ;

එවැනි වැටුප්, වේතන හා වෙනත් සමාන පාරිශ්‍රමිකයන් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළයුතු ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි ප්‍රාදේශීය බල මණ්ඩලයක් විසින් හෝ ඒවායින් ඇති කරන ලද අරමුදල් වලින් එම ගිවිසුම්කාර රාජ්‍යය වෙත හෝ බල මණ්ඩලය වෙත ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන යම් විශ්‍රාම වැටුපක් එම රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි ප්‍රාදේශීය බල මණ්ඩලයක් විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන් වන වැටුප්, වේතන විශ්‍රාම වැටුප් සහ වෙනත් සමාන පාරිශ්‍රමිකයන්ට 15, 16, 17 සහ 18 යන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

4. මෙම වගන්තියේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් "ගිවිසුම්කාර රාජ්‍යය" යන පදයට රජය, ප්‍රාදේශීය බල මණ්ඩල සහ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළත් වේ.

*20 වැනි වගන්තිය*

*මහාචාර්යවරුන්, ගුරුවරුන් සහ පර්යේෂකයන්*

1. අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයට පැමිණීමට පූර්වාසන්නයෙහි, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකව සිටි හෝ වාසිකවන මහාචාර්යවරයෙකු, ගුරුවරයෙකු හෝ පර්යේෂණකයෙකු, ඉගැන්වීම හෝ පර්යේෂණ පැවැත්වීම හෝ එම කාර්යයන් දෙකම සඳහා එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ විශ්ව විද්‍යාලයක, විද්‍යාලයක, පාසැලක හෝ වෙනත් සමාන ගිවිසුම්කාර රාජ්‍යය විසින් පිළිගන්නා ආයතනයක එවැනි ඉගැන්වීම හෝ පර්යේෂණ පැවැත්වීම සඳහා ලැබූ ආරාධනයක් මත එම අනෙක් රාජ්‍යයට පැමිණි දින සිට එක ළඟ වසර දෙකක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් සඳහා ඔහුගේ එකී ඉගැන්වීම් හෝ පර්යේෂණ සඳහා වන පාරිශ්‍රමික එකී අනෙක් රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතු ය.

2. පර්යේෂණයක් පොදු ජනතාවගේ අවශ්‍යතාවය අනුව නොව නිශ්චිත තැනැත්තෙකුගේ හෝ තැනැත්තන්ගේ පෞද්ගලික ප්‍රතිලාභ සඳහා සිදුකරන්නේ නම් එවැනි පර්යේෂණ කිරීම වෙනුවෙන් මහාචාර්යවරයෙකු හෝ ගුරුවරයෙකු ලබන පාරිශ්‍රමික සඳහා පළවෙනි වගන්තිය යටතේ නිදහසක් ප්‍රදානය නොකළ යුතු ය.

*21 වැනි වගන්තිය*

*ශිෂ්‍යයන් සහ අභ්‍යාසලාභීන්*

1. ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකකට පැමිණීමට පූර්වාසන්නයෙහි අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන හෝ වාසිකයෙකු වූ හෝ හුදෙක් සිය අධ්‍යාපනය හෝ පුහුණුව සඳහා පළමුව සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි සිටින ශිෂ්‍යයෙකු, ආධුනිකයෙකු හෝ ව්‍යාපාර අභ්‍යාසලාභියෙකුට ස්වකීය නඩත්තුව, අධ්‍යාපනය හෝ පුහුණුව සම්බන්ධ කාර්යයන් සඳහා කරන ගෙවීම් එම රාජ්‍යයට පරිබාහිර ප්‍රභවයන්ගෙන් පැන නගින්නේ නම්, එම රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතු ය.

2. පළමු ඡේදය මගින් ආවරණය නොවන ප්‍රදාන, ශිෂ්‍යත්ව සහ පාරිශ්‍රමික සම්බන්ධයෙන්, පළමු ඡේදයේ විස්තර කර ඇති ශිෂ්‍යයෙකු හෝ පුහුණු ව්‍යාපාර අභ්‍යාසලාභියෙකු හට ඔහු සංචාරය කරනු ලබන ගිවිසුම්කාර රාජ්‍යයෙහි වාසිකයෙකුට ලබාදී ඇති බදු සම්බන්ධ නිදහස් කිරීම්, සහන හෝ අඩු කිරීම් අධ්‍යාපන හා පුහුණු කාලය තුළ හිමි විය යුතු ය.

*22 වැනි වගන්තිය*

*වෙනත් ආදායම්*

1. මෙම ගිවිසුමෙහි පූර්ව වගන්තිවල සඳහන් නොවන, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකුගේ ආදායම් අයිතමයන්, කුමන ස්ථානයක උද්ගත වුව ද, එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතු ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී රාජ්‍යයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි නම් හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථාවර පදනමක් මගින් එම අනෙක් රාජ්‍යයේ ස්වාධීන පුද්ගලික සේවාවන් ඉටු කරයි නම් සහ ආදායම ගෙවනු ලබන අයිතිවාසිකම් හෝ දේපළ ඉහත සඳහන් ස්ථිර ආයතනයට හෝ ස්ථාවර පදනමට ඵලදායී ලෙස සම්බන්ධ වී ඇත්නම්, 6 වන වගන්තියේ දෙවන ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි නිශ්චල දේපළවලින් ලැබෙන ආදායම හැර, අනෙකුත් ආදායම්වලට මෙම වගන්තියෙහි පළමුවන ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එබඳු අවස්ථාවන්හී දී 7 වන වගන්තියේ හෝ 14 වන වගන්තියේ විධිවිධාන අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුත්තේ ය.

3. මෙම වගන්තියේ 1 වන සහ 2 වන ඡේදවල කුමක් සඳහන් වුවද ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන පුද්ගලයෙකු සූදු ක්‍රීඩා හා ලොතරැයි මගින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී උපයාගනු ලබන ආදායම් අයිතමයන් එම අනෙක් රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකි ය.

*23 වැනි වගන්තිය*

*ද්විත්ව බදුකරණය ඉවත් කිරීම*

1. ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයන් අන්තර්ගත නොවන්නේ නම්, ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් කවරක හෝ බලපවත්නා නීති මගින් අදාළ ගිවිසුම්කාර රාජ්‍යයන්හිදී ආදායම් (ලාභ) මත බදු අයකිරීමට තවදුරටත් පාලනය වනු ඇත. ගිවිසුම ප්‍රකාරව ආදායම (ලාභ) ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිදීම බද්දට යටත් වන්නේ නම්, ද්විත්ව බදුකරණය ඉවත් කර ගැනීම මෙම වගන්තියේ පහත සඳහන් ඡේදයන්ට අනුකූලව සිදුකරනු ඇත.

2. මෙම ගිවිසුමෙහි විධිවිධාන හා අනුකූලව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු ආදායම (ලාභ) උපයන කල්හි, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකි අතර එකී අනෙක් රාජ්‍යයේදී ගෙවනු ලබන ආදායම් (ලාභ) බද්ද, පළමු සඳහන් කළ රාජ්‍යය විසින් පනවන ලද ආදායම් (ලාභ) මත බද්ද සඳහා බැරක් ලෙස ඉඩ දිය යුතු ය.

කෙසේ වුව ද, කවර අවස්ථාවකදී හෝ බැර ලබා දීමට පෙර ගණනය කරන ලද පරිදි, ආදායම් (ලාභ) බද්දේ එකී කොටස එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ බදු අයකළ හැකි ආදායම (ලාභය) ට ආරෝපණය කළ හැකි බද්ද නොඉක්මවිය යුතු ය.

3. මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් උපයනු ලබන ආදායම (ලාභ) එකී රාජ්‍යයේදී බද්දේන් නිදහස්වන විට, එසේකුදු වුවත්, එම රාජ්‍ය විසින් එම වාසිකයාගේ ඉතිරි ආදායම (ලාභ) මත බදු මුදල ගණනය කිරීමේදී එසේ නිදහස් කරනු ලැබූ ආදායම (ලාභ) සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

4. මෙම වගන්තියේ කාර්යය සඳහා ගිවිසුම්කාර රාජ්‍යයකදී ගෙවන ලද ආදායම් බද්ද යන්නට, ආර්ථික සංවර්ධනය හෝ ආයෝජන ප්‍රවර්ධනය සඳහා එම රාජ්‍යයේ නීති යටතේ ලබා දී ඇති යම් කාල පරිච්ඡේද සඳහා වන බදු දිරි දීමනාවන්ට අනුව ගෙවිය යුතුව තිබුමුත් අඩුකර හෝ අත්හරිනු ලැබ ඇති ආදායම් (ලාභ) බද්ද ඇතුළත්සේ සැළකිය යුත්තේ ය.

*24 වැනි වගන්තිය*

*වෙනස් ලෙස නොසැලකීම*

1. එක් ගිවිසුම්කාර රාජ්‍යයක ජාතිකයන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී, වාසික භාවය සම්බන්ධයෙන්, විශේෂිතව, ඒ හා සමාන තත්ත්වයේ සිටින ජාතිකයන්ට වඩා වෙනස් වූ හෝ දැරීමට වඩාත් දුෂ්කර වූ යම් බදු අය කිරීමකට හෝ ඒ හා සම්බන්ධ යම් අවශ්‍යතාවයකට යටත් කරනු නොලැබිය යුතුය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායයකට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයක් සම්බන්ධයෙන් බදුකරණය, එම කටයුතු වලම නියැලෙන එම අනෙක් රාජ්‍යයේ ව්‍යවසායන් පිළිබඳ බදුකරණයට වඩා අඩු වාසි සැලසෙන පරිදි එකී අනෙක් රාජ්‍යයේදි බදු අය නොකළ යුතුය. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් සිය වාසිකයන්ට සිවිල් තත්ත්වය හෝ පවුලේ වගකීම් හේතු කොටගෙන බදු කාර්යය සඳහා දෙනු ලබන පෞද්ගලික දීමනා, සහන සහ අඩු කිරීම්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයන්ට ලබාදීමට මෙම විධිවිධානය මගින් බැඳෙනු ඇතැයි යනුවෙන් තේරුම් නොගත යුතු ය.

3. 7 වන වගන්තියේ 3 වන ඡේදයේ, 9 වන වගන්තියේ 1 වන ඡේදයේ, 11 වන වගන්තියේ 7 වන ඡේදයේ හෝ 12 වන වගන්තියේ 6 වන ඡේදයේ විධිවිධාන බලපවත්නා අවස්ථාවලදී හැර, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයකුට ගෙවනු ලබන පොළී, රාජ්‍යභාග සහ අනෙකුත් වියදම් එවැනි ව්‍යවසායක බදු අයකළ හැකි ලාභ නිර්ණය කිරීමේ කාර්යය සඳහා පළමුව සඳහන් රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලැබූ ආකාරයට එම කොන්දේසි යටතේ ම අඩු කළ යුතු ය. එම ආකාරයෙන්ම, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ඇති ඕනෑම ණයක් එවැනි ව්‍යවසායක බදු අයකළහැකි වත්කම් තීරණය කිරීමේ කාර්යය සඳහා, පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු සමග ගිවිසුමකට එළැඹුනේ නම් අඩුකරන ආකාරයටම එම කොන්දේසිවලට යටත්වම අඩුකළ යුතු ය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායයන්හි ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් වශයෙන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු හෝ වාසිකයන් වැඩි දෙනෙකු විසින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් අයත් කරගෙන සිටින කල්හි හෝ පාලනය කරනු ලබන කල්හි, එකී පළමුව සඳහන් රාජ්‍යයේ එබඳු වෙනත් ව්‍යවසායයන් යටත්වන හෝ යටත් කළ හැකි වන බදුවලට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට වඩා වෙනස් වූ හෝ ඉසිලීමට වඩා දුෂ්කර වූ කිසිදු බද්දකට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට එකී පළමුව සඳහන් රාජ්‍යයෙහි දී යටත් කරනු නොලැබිය යුතු ය.

5. මෙම වගන්තියේ "බදුකරණය" යන පදයෙන් මෙම ගිවිසුමට යටත් බදු අදහස් වේ.

*25 වැනි වගන්තිය*

*අන්‍යොන්‍ය එකඟත්ව ක්‍රියාපිළිවෙළ*

1. ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙන් එකක හෝ දෙකෙහිම ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ගිවිසුමේ විධිවිධානයන්ට අනුකූල නොවන අයුරින් තමා බදුකරණයට පාත්‍රවන්නේ යයි හෝ එසේ පාත්‍රවී ඇතැයි යම් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු සලකන අවස්ථාවක, එකී රාජ්‍යයන්හි අභ්‍යන්තර නීති මගින් සලසා ඇති ප්‍රතිකර්මයන් නොසලකා, ඔහු වාසිකයකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා වෙත හෝ ඔහුගේ සිද්ධිය, 24 වැනි වගන්තියේ 1 වැනි ඡේදය යටතට පත්වේ නම්, ඔහු ජාතිකයකු වන රාජ්‍යයේ නිසි බලධරයා වෙත කරුණු ඉදිරිපත් කිරීමට ඔහුට හැකි ය. මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූල නොවන බදුකරණය උද්ගතවීමට හේතුවන ක්‍රියාව පිළිබඳ ප්‍රථම දැන්වීමෙන් පසුව වර්ෂ තුනක් ඇතුළත එකී කරුණු ඉදිරිපත් කිරීම කළ යුතු ය.

2. විරෝධතාවය යුක්ති සහගත යයි නිසි බලධරයාට පෙනී යන්නේ නම් සහ තනිව යෝග්‍ය විසඳුමක් කරා එළඹීමට ඔහු අපොහොසත් වන්නේ නම්, මෙම ගිවිසුමට අනුකූල නොවන බදුකරණය වළක්වාලීමේ අදහසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා සමඟ අන්‍යොන්‍ය එකඟත්වයෙන් තත්ත්වය නිරාකරණය කර ගැනීමට ඔහු උත්සාහ කළ යුතු ය. එළඹෙන ලද යම් එකඟතාවයක් ගිවිසුම්කාර රාජ්‍යයන්හි දේශීය නීතීන් යටතේ පවතින කාලය පිළිබඳ යම් සීමා කිරීම්වලට යටත් නොකර ක්‍රියාත්මක කළ යුතු ය.

3. මෙම ගිවිසුම අර්ථ නිරූපනය කිරීම හෝ අදාළ කිරීම සම්බන්ධයෙන්, යම් දුෂ්කරතාවයක් හෝ සැකයක් පවතීනම් ඒවා ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධරයන්ගේ අන්‍යොන්‍ය එකඟත්වයෙන් නිරාකරණය කරගැනීමට උත්සහ කළ යුතු ය. මෙම ගිවිසුමෙහි විධිවිධාන සලසා නොමැති අවස්ථාවන්හිදී ද ද්විත්ව බදුකරණය ඉවත් කිරීම සඳහා ඔවුන් සාමූහිකව සාකච්ඡා කළ යුතු ය.

4. පෙරාතු ඡේදවල අර්ථානුකූලව එකඟතාවයකට එළඹීමේ කාර්යය සඳහා ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන්ට කෙළින්ම එකිනෙකා අතර අදහස් හුවමාරු කරගත හැකි ය.

*26 වැනි වගන්තිය*

*තොරතුරු හුවමාරු කර ගැනීම*

1. බදුකරණය මෙම ගිවිසුමට ප්‍රතිවිරුද්ධ නොවනතාක් දුරට, මෙම ගිවිසුමෙහි විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමෙහිලා හෝ ගිවිසුම්කාර රාජ්‍යයන් වෙනුවෙන් හෝ ඒවායේ ප්‍රාදේශීය බල මණ්ඩල වෙනුවෙන් පනවන ලද ඕනෑම විස්තරයකට අයත් බදු සම්බන්ධයෙන් වන දේශීය නීතීන් පරිපාලනය හෝ බලාත්මක කිරීම සඳහා හෝ අදාළ වන්නේ යැයි පූර්ණ නිගමනයකට එළඹිය හැකි තොරතුරු ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධරයන් විසින් හුවමාරු කර ගතයුතු ය. තොරතුරු හුවමාරු කර ගැනීම 1 වැනි හා 2 වැනි වගන්තිවලින් සීමා නොකෙරේ.

2. 1 වැනි ඡේදය යටතේ ගිවිසුම්කාර රාජ්‍යයකට ලැබෙන යම් තොරතුරක්, එම රාජ්‍යයේ දේශීය නීති යටතේ ලබාගත් තොරතුරු රහස්‍ය සේ සලකන පරිද්දෙන්ම සැලකිය යුතු අතර, පළමුවන ඡේදයෙහි සඳහන් හෝ බදුවලට අදාළව තක්සේරු කිරීම හෝ අයකිරීම, එම බදු බලාත්මක කිරීම හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීම, හෝ 1 වැනි ඡේදයෙහි සඳහන් බදු සම්බන්ධ හෝ ඉහත ප්‍රමාද දෝෂයකින් වූ වරදක් හෝ වන අභියාචනයක් තීරණය කිරීම හා සම්බන්ධ වූ තැනැත්තන්ට හා බලධරයන්ට (උසාවි හා පරිපාලන මණ්ඩල ද ඇතුළුව) පමණක් හෙළි කළ යුතු ය. එවැනි තැනැත්තන් හෝ බලධරයන් එවැනි කටයුතු සඳහා පමණක් මෙම තොරතුරු භාවිතා කළ යුතු ය. ඔවුන්ට ප්‍රසිද්ධ උසාවි කටයුතුවල දී හෝ අධිකරණ ක්‍රියා කටයුතුවලදී එම තොරතුරු හෙලි කළ හැකි ය.

3. 1 වැනි සහ 2 වැනි ඡේදයන්හි විධිවිධාන මගින් ගිවිසුම්කාර රාජ්‍යයක් මත, පහත සඳහන් බැඳීම් පැනවෙන්නේ යයි කිසිදු අවස්ථාවක දී තේරුම් නොගත යුතු ය.

(අ) එම ගිවිසුම්කාර, රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති හෝ පරිපාලනමය භාවිතයන් වලින් වෙනස් ආකාරයට පරිපාලනමය විධිවිධාන ක්‍රියාත්මක කිරීම ;

(ආ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ හෝ සාමාන්‍ය පරිපාලන ක්‍රියාවලියේදී ලබාගත නොහැකි තොරතුරු සැපයීම ;

(ඇ) යම් වෙළඳ, ව්‍යාපාරික, කාර්මික, වාණිජ හෝ වෘත්තීය රහසක් හෝ වෙළෙඳ ක්‍රියාවලියක් හෝ තොරතුරක් හෙළිදරව් විය හැකි තොරතුරක් සැපයීම හෝ රජයේ ප්‍රතිපත්තියට (Ordre Public) පටහැනි වන යම් තොරතුරක් සැපයීම.

4. මෙම වගන්තියට අනුකූලව යම් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් තොරතුරු අපේක්ෂා කරන්නේ නම්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් තම බදු පරමාර්ථයන් සඳහා එවැනි තොරතුරු අවශ්‍ය නොවන්නේ වුව ද, අපේක්ෂිත තොරතුරු ලබාගැනීම පිණිස එකී තොරතුරු රැස් කිරීමේ ක්‍රියා මාර්ග භාවිතා කළ යුතු ය. පූර්ව වාක්‍යයෙහි වූ බැඳීම 3 වන ඡේදයේ සඳහන් සීමාවන්ට යටත් වන නමුත් කිසිදු අවස්ථාවක දී එකී සීමාවන් මගින් ගිවිසුම්කාර රාජ්‍යයක්, හුදෙක් එවැනි තොරතුරු සම්බන්ධයෙන් දේශීය වශයෙන් උනන්දුවක් නැති නිසාම එම තොරතුරු සපයාදීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩදීමක් ලෙස තේරුම් නොගත යුතු ය.

5. තොරතුරු, බැංකුවක් භාරයේ පැවතීම, වෙනත් මූල්‍ය ආයතනයක් භාරයේ පැවතීම, නාමිකයෙකු වශයෙන් හෝ තැනැත්තෙකු නියෝජිත ආයතනයක් වෙනුවෙන් ක්‍රියාකිරීම හෝ පීත කොමිසම් භාරකරු වශයෙන් කටයුතු කිරීම මත තබා ගැනීම හේතුවෙන්ම හෝ එය තැනැත්තෙකු ගේ අයිතිය පිළිබඳ හිමිකම්වලට සම්බන්ධ වූවක් නිසාම හුදෙක් එම තොරතුරු සපයාදීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩදීමක් ලෙස 3 වන ඡේදයේ සඳහන් විධිවිධාන වටහා නොගත යුතු ය.

*27 වැනි වගන්තිය*

*රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සාමාජිකයින් සහ කොන්සල් තනතුරු*

ජාත්‍යන්තර නීතියේ පොදු නීති රීති යටතේ හෝ විශේෂ ගිවිසුම්වල විධිවිධාන යටතේ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සාමාජිකයින්ගේ හෝ කොන්සල් තනතුරුවලට අයත් මූල්‍ය වරප්‍රසාද කෙරෙහි මෙම ගිවිසුමේ කිසිවක් බලා නො පෑ යුතු ය.

*28 වැනි වගන්තිය*

*බලාත්මකවීම ආරම්භ වීම*

1. මෙම ගිවිසුම බලාත්මක කිරීම සඳහා ස්වකීය නීතිය මගින් අවශ්‍ය කෙරෙන කාර්යය පටිපාටි සම්පූර්ණ කර ඇති බව එක් එක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් රාජ්‍ය තාන්ත්‍රික මාර්ගයන් හරහා අනෙක් රාජ්‍යයට දන්වා සිටිය යුතු ය. මෙම දැනුම්දීම් අතුරින් පසුව කෙරෙන දැනුම්දීමේ දින සිට මෙම ගිවිසුම බලාත්මක විය යුතු ය.

2. මෙම ගිවිසුම

(අ) ප්‍රභවයේදී රඳවාගත් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක වන දිනට ඉක්බිතිවම එළඹෙන පළවෙනි ලිත් වර්ෂයේ ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව උද්ගතවන ආදායම වෙනුවෙන් ; සහ

(ආ) අනෙකුත් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක වන වර්ෂයට ඉක්බිතිවම එළැඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස 1 දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි වර්ෂයක් සඳහා වන බදු වෙනුවෙන් ;

බල පැවැත්විය යුතු ය.

*29 වැනි වගන්තිය*

*අවසන් කිරීම*

යම් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් අවසන් කරනු ලබන තෙක් මෙම ගිවිසුම බල පැවැත්විය යුතු වේ. ගිවිසුම බලාත්මක වන දිනයේ සිට වසර පහක කාල පරිච්ඡේදයකින් පසුව එළැඹෙන ඕනෑම ලිත් වර්ෂයක් අවසන්වීමට අඩු වශයෙන් මාස හයකට පෙර රාජ්‍ය තාන්ත්‍රික මාර්ග හරහා අවසන් කිරීම පිළිබඳ නිවේදනයක් මගින් කවර හෝ ගිවිසුම්කාර රාජ්‍යයකට මෙම ගිවිසුම අවසන් කළ හැකි ය.

එවැනි අවස්ථාවක දී :

(අ) ප්‍රභවයේදී රඳවාගත් බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබා දුන් ලිත් වර්ෂයට ඉක්බිතිව එළැඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමුවන දින හෝ ඉන් පසුව උද්ගතවන ආදායම මත ;

(ආ) අනෙකුත් බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබාදෙන ලද ලිත් වර්ෂයට ඉක්බිතිවම එළැඹෙන වර්ෂයේ ජනවාරි මස පළමු වැනි දින හෝ ඉන්පසුව ආරම්භවන බදු අය කළ හැකි වර්ෂයන්හිදී උපයන ලද ආදායම් මත මෙම ගිවිසුම ක්‍රියාත්මක වීම අවසන් වන්නේ ය.

මීට සාක්ෂි වශයෙන් විධිමත් පරිදි බලය පවරනු ලැබූ මෙහි පහත සඳහන් කරන අය මෙම ගිවිසුමට අත්සන් තබන ලදී.

එක හා සමාන බල සහිත සියලුම පාඨයන්ගෙන් යුක්ත, සිංහල, රුසියන් සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පිටපත් දෙකකින් යුතුව මින්ස්ක් හිදී, 2013 අගෝස්තු මස 26 වන දින අත්සන් තබන ලදී. අර්ථ නිරූපනයේදී ප්‍රතිවිරුද්ධතාවක් ඇතිවුවහොත් ඉංග්‍රීසි පාඨය බල පැවැත්විය යුතු ය.

උදයන්ග වීරතුංග,
රුසියාවේ ශ්‍රී ලංකා තානාපති,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන්

ව්ලැඩිමීර් එන්. පොලුයාන්,
බදු සහ තීරු බදු අමාත්‍ය.
බෙලාරුස් ජනරජයේ
ආණ්ඩුව වෙනුවෙන්.

12 - 355

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.